**මැදවච්චිය ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වත්කම් 04 ක් බදු දීම වෙනුවෙන් ලැබිය යුතු ආදායම රු.1,320,451 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ලෝක ළමා දිනය සැමරීම වෙනුවෙන් පැවැත්වූ වැඩසටහනක් සඳහා පරිත්‍යාග ලෙස ලැබුණු රු.85,000 ක් පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදාන ලෙස දැක්වීම වෙනුවට විවිධ ආදායම් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | -එම- | පුනරාවර්තන පරිත්‍යාග නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබුණු වටිනාකම රු.14,000,000 ක්වූ ජල බවුසරය සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ මිලට ගැනීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | ප්‍රාග්ධන සංයුතිය වැඩිවී ඇති බැවින් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස සැලකූ බව. | මුදල් ගලා ඒමක් සිදුවී නොමැති බැවින් ආයෝජන ක්‍රියාකාරකමක් ලෙස නොසැලකිය යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වත්කම් සහ වගකීම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන රු.47,266,860 ක් වුවත් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය අනුව එය රු.30,549,562 ක් වුයෙන් රු.16,717,298 ක වෙනසක් විය. | ප්‍රාග්ධන ප්‍රදාන ගැලපීම නිසා වෙනසක් සිදුවී ඇති බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතු වේ. |

**1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකමට රු.9,848,464 ක් වු ගිණුම් විෂයයන් 10 කට අදාළව ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ලිපිගොනුවක් පමණක් ඇති බව. | තහවුරු කිරීම ඉදිරිපත් කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වු වියදම රු.11,835,280 ක් වු අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.3,868,526 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,024,692 | 4,501,647 | 3,590,980 | 4,933,864 | 4,158,657 | 4,730,492 | 2,759,509 | 4,023,197 |
| (ii) | කුලී | 23,069,415 | 18,328,055 | 11,378,639 | 27,515,574 | 21,456,563 | 14,140,764 | 4,687,042 | 20,566,158 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 361,730 | 502,683 | 502,683 | 90,500 | 4,322,703 | 7,358,662 | 7,374,022 | 90,500 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (iv) | වෙනත් ආදායම් | 13,246,712 | 20,503,417 | 21,768,719 | 15,430,776 | 5,436,146 | 5,169,769 | 8,536,443 | 16,696,078 |
| | | ------------- | ------------ | ------------- | ------------- | ------------- | ----------- | ----------- | ------------ |
| | | 40,702,549 | 43,835,802 | 37,241,021 | 47,970,714 | 35,374,069 | 31,399,687 | 23,357,016 | 41,375,933 |
| | | ======== | ======== | ======== | ======== | ======== | ======= | ======= | ======== |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | 2015 වර්ෂයේ තක්සේරුව පදනම්ව වරිපනම් බිල්කිරීම් සිදුකරමින් පැවති අතර 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.4,217,014 ක් විය. | පිළිගන්නා බව. | නව වෙනස්වීම්වලට අනුව බිල් කිරීම් සිදුකළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත බදු රු.231,750 ක් හා හිඟ ව්‍යාපාර බදු රු.485,100 ක් විය. | -එම- | අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | 2018 වර්ෂයේදී සිදුකළ තක්සේරුව අනුව බදු දී තිබුණු ප්‍රාදේශීය සභා පැරණි වෙළඳ සංකීර්ණයේ කඩකාමර 54 ක් සඳහා 2022 මාර්තු 04 දිනැති අංක 2022/03/03/11/විශේෂ මහා සභා තීරණය අනුව මාසික කුලියෙන් 50% ක් පමණක් අයකිරීමට කටයුතු කර තිබුණි. ඒ සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | -එම- | පනත ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දින වනවිට වසර 04 කට අධික කාලයක සිට අයනොවී පවතින රු.24,088,687 ක බදුදීම් කුලී සහ රු.3,222,637 ක දේපළ කඩකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වසර 01 ත් 03 ත් අතර කාලයක සිට අයවී නොමැති යන්ත්‍ර කුලී රු.204,250 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | -එම- | අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නව වෙළඳ සංකීර්ණයේ කුලී නියමිත දිනට නොගෙවීම නිසා අය කළ යුතු ප්‍රමාද ගාස්තු රු.8,706,079 ක් අයකර ගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (v) | බල ප්‍රදේශයේ පිහිටි දැන්වීම් පුවරු හා දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ඒවා ලේඛණගත කර නොතිබුණු අතර දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.638,550 ක් විය. | -එම- | -එම- |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.2,820,849 ක් හා මුද්දර ගාස්තු රු.2,552,450 ක් ලැබිය යුතුව තිබුණි. | -එම- | ගෙන්වා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ගව ඝාතකාගාර පවත්වාගෙන යාම** | | |
| මුස්ලිම්හල්මිල්ලෑව, උඩුම්බුගල සහ සියඹලාගස්කඩ මස්හල් සඳහා අවශ්‍ය ගවඝාතකාගාර ඉදිකර නොතිබීම නිසා උඩුම්බුගල හා සියඹලාගස්කඩ මස්හල් ලබා ගැනීමට ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් වී නොතිබුණි. එම නිසා නීති විරෝධි ගෝඝාතකාගාර හරහා මස් වෙළඳාම සිදුවෙමින් පැවතුණි. | පිළිගන්නා බව. | ගවමස් වෙළඳාම විධිමත් කළ යුතුය. |
| **(ආ) සතිපොළ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම** | | |
| 2020 වර්ෂයේදී රු.1,222,415 ක් වියදම් කර ඉදිකරන ලද වැසිකිළිය භාවිතයට ගත හැකි වන පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණු අතර 2022 ජුනි 01 දින රු.38,780 කට මිලදීගත් උපකරණද එහි සවිකර නොතිබුණි. | ඉදිරියේදී නිසි ප්‍රසම්පාදන කටයුතු සිදු කරන බව සහ විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | ඉදිකිරීම් සම්පූර්ණ කර විධිමත්ව පවත්වාගෙන යාමට ක්‍රියාකළ යුතුය. |

## 3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබූ නමුත් එය සක්‍රියව ක්‍රියාත්මක නොවීම නිසා සභා බලප්‍රදේශයේ එකතුවන කසළ ඉසින්බැස්සගල රක්ෂිතයේ විවෘත භූමිය තුළ බැහැර කර ගිනිතැබීම සිදුවෙමින් පැවතුණි. | පිළිගන්නා බව. | විධිමත් පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සිදුකළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතු වටිනාකම රු.1,075,000 ක් වූ ඩබල් කැබ් රථයක් හා වටිනාකම රු.1,319,050 ක් වූ මහේන්ද්‍රා කැබ්රථය සභිකයෙකු විසින් සිය අභිමතය පරිදි වසරකට පෙර අවිධිමත්ව සහ සභා අනුමැතියකින් තොරව වාහන අළුත්වැඩියා කිරීම් ආයතනයකට රැගෙන ගොස් තිබුණි. | පිළිගන්නා බව. | මෙම වාහන සභාව වෙත රැගෙන ඒමට ක්‍රියාකළ යුතුය. |
| (ආ) | වසර 03 කට පෙර අළුත්වැඩියාව සඳහා සභාව අසල ගරාජයක් වෙත ගෙන ගොස් තිබුණු වටිනාකම රු.1,000,000 ක් වූ විදුලිජනක යන්ත්‍රය කැබලි වශයෙන් අනාරක්ෂිතව අදාළ ගඩබාවේ ගොඩගසා තිබුණු අතර අදාළ අළුත්වැඩියාව සිදුකර එම යන්ත්‍රය සභාව වෙත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | මෙම යන්ත්‍රය සභාවට රැගෙන ඒමට කඩිනමින් ක්‍රියාකළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ ඉහළ මහලේ පිහිටි සභා ශාලාවේ රු.706,140 ක් වැයකර සවිකරන ලද වායු සමීකරණ 06 ක් තෙකලා විදුලි පද්ධතියට සවිකිරීම සඳහා වන විදුලි රැහැන් ප්‍රමිතයට සකස් නොකිරීම නිසා වසර 03 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | පිළිගන්නා බව. | විදුලි රැහන් පද්ධතිය ප්‍රමිතිගත පරිදි සවි කිරීමට ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සී.පී.නගරයේ අංක 01 සහ 02 කඩ කාමර සඳහා 2020 සහ 2021 වර්ෂ සඳහා අයවිය යුතු කඩ කුලී සභාපතිවරයාගේ පෞද්ගලික අභිමතය පරිදි කපාහැරීමට කටයුතු කිරීම නිසා සභාවට රු.905,500 ක ආදායමක් අහිමි වී තිබුණි. මෙම කඩ කාමර සඳහා 2022 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.606,000 ක කුලියද ඔහු විසින් ගෙවා නොතිබුණි. | -එම- | අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නික්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් පිළිසරු ඒකක පරිශ්‍රයේ 2019 වර්ෂයේදී ජල පිරිපහදුව ඉදිකිරීමේදී සභාව නොසැලකිල්ලෙන් කටයුතු කිරීම නිසා රු.2,343,240 ක් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණු අතර වාර්ෂිකව රු.288,000 ක අමතර පිරිවැයක් වැයකර පිටතින් පානීය ජලය මිලදී ගැනීම සිදු කරමින් පැවතුණි. | පිළිගන්නා බව. | අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කර ජල පිරිපහදුව ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා ඉහළ මහලේ පිහිටි සභා ශාලාවේ රු.227,139 ක වියදමින් ඉදිකළ වැසිකිළි පද්ධතියට ජල සම්පාදන ක්‍රමයක් ඉදිනොකිරීම නිසා වසර 04 ක කාලයක සිට භාවිතා කළ නොහැකිව පැවතුණි. | -එම- | ජල සම්පාදන ක්‍රමයක් ඇති කිරීමට ක්‍රියා කළ යුතුය. |

**3.6 අවිධිමත් ගනුදෙනු**

| විගණන නික්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු කැබ්රථයක් 2020 ජුනි 16 දින ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පදවමින් සිටියදී අනතුරට ලක්වී තිබුණු අතර ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 104(3) සහ මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව ආරම්භක හා පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. අනතුර සිදුවන අවස්ථාවේ රියදුරු ලෙස කටයුතු කළ හිටපු සභාපතිවරයා විසින් සිය අභිමතය පරිදි එය අනුරාධපුර රජරට ඔටෝමොබයිල් බ්‍යුරෝ (Rajarata Auto Mobile Bureau) ආයතනය වෙත ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව රැගෙන ගොස් තිබුණි. මේ සඳහා අග්‍රහාර රක්ෂණ සමාගමෙන් ලැබුණු රු.414,081 ක් යාන්ත්‍රික ඉංජිනේරු | පිළිගන්නා බව. | මෙම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර වාහනය සභාව වෙත රැගෙන ඒමට ක්‍රියා කළ යුතුය. |

නිර්දේශයකින් තොරව අළුත්වැඩියා කළ ආයතනය වෙත ගෙවීම් කර තිබුණි.

## 3.7 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය අනුව වටිනාකම රු.100,069 ක්වූ පොත් 545 ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි පොත් 81 ක් මැදවච්චිය පුස්තකාලයෙන් අස්ථානගතවී තිබුණු නමුත් එම අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | අලාභය වගකිව යුතු පාර්ශ්ව වෙතින් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

## 3.8 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ කෘ කැබ් රථය සඳහා 2021 නොවැම්බර් 18 හා 2022 මාර්තු 19 දිනවල මිලදීගත් වටිනාකම රු.179,700 ක් වූ ටයර් 10 ක් සවිකළ බවට තහවුරු නොවුණු බැවින් ඒ පිළිබඳ විමර්ශන පවත්වා අදාළ රියදුරුගෙන් හා වගකිවයුතු පාර්ශවවලින් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | විධිමත් පරීක්ෂාවක් සිදුකර මෙම අලාභය අදාල පාර්ශව වෙතින් අයකර ගැනීමට ක්‍රියාකළයුතු අතර නැවත මෙවැනි සිදුවීම ඇතිනොවීමට අවභා අභ්‍යන්තර පාලනයක් ඇති කළ යුතුය. |